# මාධ්‍ය සටහන

# කාර්තුගත දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු

## 2011 තෙවැනි කාර්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව.

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර (2002) හා පවත්නා මිල යටතේ ඇස්තමේන්තු කරන ලද 2011 තෙවැනි කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය මෙයින් ප්‍රකාශයට පත් කෙරේ.

ශ්‍රී ලංකා ආර්ථිකයේ සමස්ත නිෂ්පාදනය මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතය (දදේනි) ස්ථාවර (2002) මිල යටතේ 2010 තෙවැනි කාර්තුවේ (ජූලි - සැප්තැම්බර්) පැවති රුපියල් මිලියන (රු.මි.) 690,160 සිට 2011 තෙවැනි කාර්තුවේ රු.මි. 748,423 දක්වා ඉහළ යමින් සියයට 8.4ක වර්ධනයක් පෙන්විය.

මෙම කාර්තුවේදී ආර්ථිකයේ ප්‍රධාන අංශ වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශ පිළිවෙලින් සියයට 6.2කින්, 10.8කින් හා 7.8කින් වර්ධනය විය. ප්‍රධාන අංශවල උප අංශ අතර, “වී” සියයට 12.4, “ධීවර” සියයට 17.3, “පතල් හා කැණීම්” සියයට 19.6, “ඉදිකිරීම්” සියයට 17.3, “තොග හා සිල්ලර වෙළෙඳාම” සියයට 9.5, “හෝටල් හා ආපනශාලා” සියයට 27.2, හා “ප්‍රවාහනය හා සන්නිවේදනය” සියයට 9.9ක් ලෙස ඉහළ වර්ධනයක් පෙන්විය.

දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශවල දායකත්වය පිළිවෙලින් සියයට 11.7, 29.1, හා 59.2ක් ලෙස පැවතිණි.

ආර්ථිකයේ සියලු භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය මිල මට්ටම නිරූපණය කෙරෙන දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය අවධමනකය (2002=100) 2010 තෙවැනි කාර්තුවේ පැවති දර්ශකාංක 203.9 සිට 2011 තෙවැනි කාර්තුවේදී දර්ශකාංක 220.1 දක්වා ඉහළ ගොස් උද්ධමන අනුපාතය සියයට 7.9ක් ලෙස වාර්තා විය.

පාරිභෝගික භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය මිල මට්ටම පිළිබිඹු කෙරෙන කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/2007=100), 2010 තෙවැනි කාර්තුවේ පැවති දර්ශකාංක 141.7 සිට 2011 තෙවැනි කාර්තුවේදී දර්ශකාංක 151.6 දක්වා ඉහළ ගොස් උද්ධමන අනුපාතය සියයට 6.9ක් ලෙස සටහන් විය. 2010 තෙවැනි කාර්තුවේ මෙම උද්ධමන අනුපාතය සියයට 5.0ක් විය.

# කෘෂිකර්මාන්ත අංශය

කෘෂිකර්මාන්ත, වන හා ධීවර අංශය 2011 තෙවැනි කාර්තුවේදී සියයට 6.2කින් වර්ධනය විය. 2010 තෙවැනි කාර්තුවේදී මෙම අංශයේ වර්ධනය සියයට 6.0ක් විය.

පසුගිය වසරේ අවසාන භාගයේ සහ 2011 පළමු වැනි කාර්තුව පුරා පැවති දැඩි වර්ෂාවෙහි බලපෑමෙන් පසුබෑමකට ලක්වූ කෘෂිකාර්මික නිෂ්පාදනවල, හා ධීවර නිෂ්පාදනයේ වාර්තාවූ ඉහළ වර්ධනය 2011 තෙවැනි කාර්තුවේ කෘෂිකර්මාන්ත අංශයේ මෙම වර්ධනයට ප්‍රධාන ලෙස හේතු විය.

2011 තෙවැනි කාර්තුවේ තේ නිෂ්පාදනය එකතු කළ අගය සියයට 6.9කින් පසුබෑමට ලක් විය. පසුගිය වසරේ අදාළ කාර්තුවේ මෙම අංශය සියයට 2.8කින් වර්ධනය විය. 2011 තෙවැනි කාර්තුවට බලපෑ වියළි කාලගුණය මෙම පසුබැසීමට හේතු විය.

රබර් නිෂ්පාදන එකතු කළ අගය 2011 තෙවැනි කාර්තුවේදී සියයට 2.2කින් වර්ධනය වූ අතර 2010 තෙවැනි කාර්තුවේ මෙම අංශයේ වර්ධනය සියයට 15.9ක් විය. 2010 තෙවැනි කාර්තුවේදී රුපියල් 379.00 වූ රබර් කිලෝ එකක් සඳහා අවශ්‍ය කිරි ප්‍රමාණයෙහි සාමාන්‍ය මිල 2011 තෙවැනි කාර්තුවේදී රුපියල් 485.66 දක්වා සියයට 28.1කින් ඉහළ ගියේය.

පොල් නිෂ්පාදනය එකතු කළ අගය 2010 තෙවැනි කාර්තුවේදී සියයට 5.1කින් වර්ධනය විය. පසුගිය වසරේ තෙවැනි කාර්තුවේ මෙම අංශයේ සියයට 22.1ක පසුබෑමක් පැවතිණි. පසුගිය වර්ෂයේ පසුබෑ මෙම අංශය වර්ධනය වන දිශාවට යොමු වීම කැපී පෙනේ.

සුළු අපනයන බෝග නිෂ්පාදනය එකතු කළ අගය 2011 තෙවැනි කාර්තුවේ දී සියයට 7.9ක පසුබැසීමක් වාර්තා වන අතර 2010 තෙවැනි කාර්තුවේදී සියයට 1.5ක පසුබැසීමක් වාර්තා විය. මෙම පසුබැසීමට කරාබුනැටි නිෂ්පාදනය අඩුවීම ප්‍රධාන ලෙස හේතු විය.

2011 තෙවැනි කාර්තුවේ වී නිෂ්පාදනය එකතු කළ අගයෙහි සියයට 12.4ක වර්ධනයක් වාර්තා විය. එම අංශය 2010 තෙවැනි කාර්තුවේ සියයට 31.8කින් වර්ධනය වී තිබුණි. 1952 සිට 2011 දක්වා යල කන්නයක පැවති ඉහළම වී වගා බිම් ප්‍රමාණය, අස්වනු නෙලාගත් බිම් ප්‍රමාණය හා අස්වැන්න 2011 යල කන්නයේදී වාර්තා විය. එසේ වුවද, 2010 යල කන්නයේ අක්කරයට බුසල් 86.2ක් ලෙස පැවති බිම් ඒකක අස්වැන්න මෙම කන්නයේ දී අක්කරයට බුසල් 85.6ක් ලෙස සටහන් වෙමින් සියයට 0.6කින් පහළ ගොස් ඇත. සාමය උදාවීම, රජයේ පොහොර සහනාධාර වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, මනා ජල සැපයුමක් පවත්වා ගැනීමට හැකිවීම, හා තෙවැනි කාර්තුවේ වියළි කාලගුණය මෙම වර්ධනයට හේතු විය. උතුරු පළාත 2011 යල කන්නයේ වී නිෂ්පාදනයට කළ දායකත්වය සියයට 2.8ක් වුවද එම පළාතේ වී නිෂ්පාදනයේ වර්ධනය සියයට 284.9ක් තරම් ඉහළ අගයක් ගත්තේය. මෙම

සුවිශේෂී වර්ධනයට වී වගා බිම් ප්‍රමාණයෙහි වූ සියයට 296.1ක වර්ධනය හා අස්වැන්න නෙලාගත් බිම් ප්‍රමාණයෙහි සියයට 294.0ක වර්ධනය හේතු විය.

2011 තෙවැනි කාර්තුවේ සත්ත්ව නිෂ්පාදනය එකතු කළ අගය සියයට 6.7කින් වර්ධනය විය. මෙම වර්ධනයට කුකුළු මස්, බිත්තර, හා කිරි නිෂ්පාදනවල පැවති වැඩිවීම ප්‍රධාන ලෙස හේතු විය.

2011 තෙවැනි කාර්තුවේ ගොඩගොවිතැන් බෝග, එළවළු හා පළතුරු උප අංශ අයත් වන වෙනත් ආහාර බෝග අංශයෙහි සියයට 6.0ක වර්ධනයක් වාර්තා විය. 2011 තෙවැනි කාර්තුවේ දී ගොඩගොවිතැන් බෝග උප අංශයෙහි නිෂ්පාදනවල එකතු කළ අගය සියයට 7.2කින් ද එළවළු නිෂ්පාදනය උප අංශය එකතු කළ අගය සියයට 5.2කින් ද වර්ධනය විය.

2011 තෙවැනි කාර්තුවේ සමස්ත ධීවර නිෂ්පාදනය එකතු කළ අගය සියයට 17.3කින් වර්ධනය විය. ඒ තුළ මිරිදිය ධීවර නිෂ්පාදනය සියයට 32.6කින් ද, කරදිය ධීවර නිෂ්පාදනය සියයට 14.3කින් ද වර්ධනය විය. උතුරු නැගෙනහිර සාමකාමී වාතාවරණය, හිතකර සාගර කාලගුණය හා මසුන් මැරීමේ නීති විරෝධී ක්‍රම දැඩි ලෙස පාලනය කිරීම කරදිය ධීවර උප අංශයේ වර්ධනයට හේතු විය.

අධික වර්ෂාපතනය හේතුවෙන් 2011 වර්ෂයේ පළමු හා දෙවැනි කාර්තුවල මිරිදිය ධීවර කර්මාන්තයෙහි මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පැවතිණි. එසේ වුවද, වර්ෂය පුරා ක්‍රියාත්මක වූ මතස්‍ය පැටවු බෝ කිරීමේ හා ව්‍යාප්ති කටයුතු සහ 2011 තෙවැනි කාර්තුවේ පැවති වියළි කාලගුණය හේතුවෙන් නිෂ්පාදනය ඉහළ යාම මෙම අංශයේ ඉහළ වර්ධනයට හේතු විය.

# කර්මාන්ත අංශය

කර්මාන්ත අංශය 2011 තෙවැනි කාර්තුවේදී සියයට 10.8කින් වර්ධනය විය. 2010 තෙවැනි කාර්තුවේ කර්මාන්ත අංශය සියයට 8.8කින් වර්ධනය වී තිබුණි. මෙම අංශයට ඉහළම දායකත්වය සපයන නිෂ්පාදන කර්මාන්ත උප අංශය සියයට 7.7කින් වර්ධනය විය.

2011 තෙවැනි කාර්තුවේ පතල් හා කැණීම් අංශයේ සියයට 19.6ක වර්ධනයක් වාර්තා විය. මැණික් අපනයන ප්‍රමාණය හා වටිනාකම පිළිවෙලින් සියයට 21.4කින් හා 42.0කින් වැඩි වී ඇත.

මෙම කාර්තුවේදී කර්මාන්තශාලා නිෂ්පාදන අංශය සියයට 7.9කින් වර්ධනය විය. “ආහාරපාන”, “රෙදිපිළි, ඇඟලුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන” හා “රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල් නිෂ්පාදන හා රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන” උප අංශ පිළිවෙලින් සියයට 7.2කින්, 10.2කින් හා 8.1කින් වර්ධනය විය. සමස්ත අපනයන ආදායමට සියයට 70.0කට වැඩි දායකත්වයක් සපයන කර්මාන්ත අපනයන ආදායම (රුපියල් වටිනාකම අනුව) සියයට 78.8කින් වැඩි විය.

විදුලිය, ගෑස් සහ ජලය උප අංශයෙහි 2011 තෙවැනි කාර්තුවේදී සියයට 7.1ක ඉහළ වර්ධනයක් වාර්තා විය. මෙම අංශයට ඉහළම දායකත්වය සපයන විදුලිය උප අංශය සියයට 7.0කින් වර්ධනය වී ඇත. ජල විදුලිබල උත්පාදනය සියයට 51.8කින් අඩු වුවද, තාප විදුලිබල උත්පාදනය සියයට 89.5කින් වැඩි විය.

ඉදිකිරීම් උප අංශයෙහි කාර්තුවක් තුළ වාර්තා වූ ඉහළම වර්ධන වේගය වූ සියයට 17.3ක වර්ධනයක් 2011 තුන්වැනි කාර්තුවේදී වාර්තා විය. මෙයට පෙර කාර්තුවක වාර්තාවූ ඉහළම වර්ධනය සියයට 14.3 මෙම වසරේ පළමුවැනි කාර්තුවේ පැවතිණි. 2010 තෙවැනි කාර්තුවේදී මෙම අංශයේ වර්ධනය සියයට 11.3කි. මෙම ඉහළ වර්ධනයට රට තුළ ක්‍රියාත්මක මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක පුනරුත්තාපන හා නැවත පදිංචි කිරීමේ කටයුතු විශේෂයෙන් හේතුවී ඇත.

2010 තෙවැනි කාර්තුවේ මෙට්‍රික් ටොන් 1,010,080ක් වූ මුළු සිමෙන්ති සැපයුම 2011 තෙවැනි කාර්තුවේ මෙට්‍රික් ටොන් 1,486,408 දක්වා සියයට 47.2කින් වැඩි විය. වාණිජ බැංකු විසින් නිවාස, ගොඩනැගිලි හා ව්‍යාපාර ස්ථාන ආදිය ඉදිකිරීමට හා දේපොළ සංවර්ධනයට දෙන ලද ණය ප්‍රමාණය මෙම කාර්තුව අවසානය වන විට සියයට 25.2කින් වැඩි වී තිබුණි. ආනයනික ගොඩනැගිලි ද්‍රව්‍ය පරිමා දර්ශකය 2010 තෙවැනි කාර්තුවේ පැවති දර්ශකාංක 183.5 සිට 2011 තෙවැනි කාර්තුවේ දර්ශකාංක 261.1 දක්වා සියයට 42.3කින් වැඩි විය.

# සේවා අංශය

තොග හා සිල්ලර වෙළෙඳාම, ප්‍රවාහන හා සන්නිවේදන සහ හෝටල් හා ආපනශාලා අංශවල වාර්තා වූ ඉහළ වර්ධනය හේතුවෙන් සමස්ත සේවා අංශය 2011 තෙවැනි කාර්තුවේදී සියයට 7.8කින් වර්ධනය විය. එසේ වුවද, මෙම අංශය පෙර වර්ෂයේ තෙවැනි කාර්තුවේ සියයට 8.0කින් වර්ධනය විය.

අපනයන වෙළෙඳාම් අංශය 2011 තෙවැනි කාර්තුවේදී සියයට 7.5කින් වර්ධනය වූ අතර පෙර වර්ෂයේ තෙවැනි කාර්තුවේදී සියයට 1.2කින් වර්ධනය වී තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම්ශේෂ සංඛ්‍යාලේඛන අනුව, අපනයන ආදායම රු.මි. 268,599 සිට රු.මි. 303,390 දක්වා සියයට 13.0කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳ දර්ශක අනුව මුළු අපනයන පරිමා දර්ශකය හා ඒකක මිල දර්ශකය පිළිවෙලින් සියයට7.6කින් හා 4.9කින් ඉහළ ගියේය.

ආනයන වෙළෙඳාම් අංශය 2011 තෙවැනි කාර්තුවේ සියයට 14.2කින් වර්ධනය විය. එහි 2010 තෙවැනි කාර්තුවේ වර්ධනය සියයට 11.4ක් විය. මුළු ආනයන වියදම රු.මි. 373,750 සිට රු.මි. 589,779 දක්ව සියයට 57.8කින් ඉහළ ගියේය. ආනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය පිළිවෙලින් සියයට 15.7කින් සහ 36.4කින් ඉහළ ගියේය.

2010 තෙවැනි කාර්තුවේදී සියයට 7.8කින් වර්ධනය වූ දේශීය වෙළෙඳාම් අංශය මෙම කාර්තුවේ සියයට 6.7කින් වර්ධනය විය.

2010 තෙවැනි කාර්තුවේ සියයට 32.2ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ හෝටල් සහ ආපනශාලා උප අංශය මෙම කාර්තුව තුළ ද සියයට 27.2ක වර්ධනයක් වාර්තා කළේය. 2010 තෙවැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 166,576 සිට 216,468 දක්වා සියයට 30.0කින් ඉහළ ගිය අතර සංචාරක ඉපයීම් සියයට 38.3කින් වැඩිවිය.

ප්‍රවාහන සහ  සන්නිවේදන අංශය මෙම කාර්තුව තුළ සියයට 9.9ක වර්ධනයක් පෙන්නුම් කළ අතර 2010 තෙවැනි කාර්තුවේ වර්ධනය සියයට 12.1කි. මෙම කාර්තුව තුළ මගී හා භාණ්ඩ ප්‍රවාහන උප අංශය සියයට 10.8කින්, භාණ්ඩ මෙහෙයුම් උප අංශය සියයට 1.3කින් හා තැපැල් හා විදුලි සංදේශ උප අංශය සියයට 8.4කින් වර්ධනය වී තිබුණි.

2010 තෙවැනි කාර්තුවේදී සියයට 90.0කින් ඉහළ ගිය වාහන නව ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව මෙම වසරේ තෙවැනි කාර්තුව තුළ සියයට 38.8කින් ඉහළ ගියේය. ඒ තුළ බස්රථ සියයට 43.8කින් ද ත්‍රිරෝද රථ සියයට 45.6කින් ද මෝටර් රථ සියයට 78.2කින් ද ඉහළ ගොස් තිබුණි. ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මගී ආදායම හා මගී පියාසර දුර ප්‍රමාණය සියයට 20.1කින් හා සියයට 15.1කින් පෙර වසරේ අදාළ කාර්තුවට සාපේක්ෂව ඉහළ ගියේය.

මෙම කාර්තුවේදී වරායන්හි මෙහෙයවූ භාණ්ඩ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) සියයට 3.5කින් වැඩි වූ අතර බහලු මෙහෙයුම් සියයට 0.9කින් අඩු විය. ශ්‍රී ලංකන් ගුවන් සේවයේ බහලු ප්‍රවාහනය (මෙට්‍රික් ටොන්) සියයට 6.4කින් වැඩි වී ඇත.

මෙම කාර්තුව තුළ මුළු දුරකථන සබඳතා සංඛ්‍යාවේ වැඩිවීම සියයට 10.7කි. මුදාගත් උතුරු පළාත තුළ දුරකථන සේවාවේ සිදුවූ ව්‍යාප්තිය මෙයට විශේෂයෙන් හේතු විය.

බැංකු රක්ෂණ සහ නිශ්චල දේපොළ අංශය 2011 තෙවැනි කාර්තුවේදී සියයට 7.4කින් වර්ධනය විය. පෙර වර්ෂයේ අදාල කාර්තුවේ මෙම අංශයෙහි සියයට 8.5ක වර්ධනයක් වාර්තා වී තිබුණි. බලපත්‍රලාභී විශේෂ බැංකු හා ලියාපදිංචි අනෙක් මූල්‍ය ආයතනවල වාර්තා වූ ඉහළ ලාභය සහ පොළී ආදායම මෙම වර්ධනයට මූලික වශයෙන් හේතු විය. වාණිජ බැංකු, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ලියාපදිංචි මූල්‍ය ආයතන සියල්ලෙහි ණය අත්තිකාරම් සහ තැන්පතු වටිනාකම් ද අදාළ කාර්තුවේදී සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි.

**ජාතික ගිණුම් අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.**

**දුරකථනː- 094-011-2687108, 094-011-2676345, ෆැක්ස් ː– 094-0112676572**

**විද්‍යුත් තැපැල ː–national.accounts@statistics.gov.lk,**

**අන්තර් ජාලයː- www.statistics.gov.lk**